**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2017**

----------------------------------------------

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) 24(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ සහ ආදායම් වියදම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය ව්‍යාචනය**

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

--------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

--------------------------------------------

ප්‍රමිත 1 හි 7 ඡේදය ප්‍රකාරව, ආදායම්, වියදම් හා වත්කම්, බැරකම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතු වුවද එයට පටහැනිව වාර්ෂික ගිණුම්වල ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.4 (ඩී) (ii) යටතේ අරමුදලට ලැබෙන මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කරන බව දක්වා තිබුණි.

**2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්**

මාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රාජ්‍ය ආයතන විසින් අරමුදලේ ගිණුමට සිදුකරන ලද හර හා බැර කිරීම්වලට අදාල හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමකට ගිණුම්ගත කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ හර ශේෂය රු.29,209,393 ක් විය. එහෙත් ඊට අදාළ උපලේඛනයේ එදිනට ශේෂය රු.23,468,875 ක් වූයෙන් රු.5,740,518 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය. උපලේඛනයේ සඳහන් ශේෂයෙන් රු.12,327,462 ක් වසර 2 සිට වසර 4 දක්වාත් රු.874,093 ක් වසර 5 ට වඩා පැරණි ශේෂ බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතෙහි 2.2 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් පවත්වා ගැනිමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමුච්චිත අරමුදලෙහි දක්වා ඇති අනිවාර්ය දායක මුදල් ගිණුමේ රු.21,479,409,368 ක් වු ශේෂය, රජයේ දායක මුදල් ගිණුමේ රු.33,418,512,038 ක් වූ ශේෂය හා ස්වේච්ඡාදායක මුදල් ගිණුමේ රු.33,394,939 ක් වූ ශේෂයන්ගේ නිවැරදිභාවය විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයා විසින් අරමුදල වෙත ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය දායකයා සේවය කරන ආයතනයෙන් තහවුරු කර ගැනිමට කටයුතු කර තිබුණද එම මුදල් නිවැරදිව අරමුදල වෙත ලැබුනේදැයි අරමුදලේ ගිණුම් වාර්තාවලින් තහවුරු කර ගැනිමට ක්‍රමවේදයක් නොමැති විමෙන් සමුච්චිත අරමුදලින් සමාලෝචිත වර්ෂය තුල ආපසු ගෙවන ලද රු.497,808,187 ක දායක මුදල් හා පොලිය සහ ආපසු ගෙවිය යුතු රු.474,425,527 ක දායක මුදල් හා පොලි වටිනාකමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්‍ෂණය විය.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අඥා පනතේ (621 අධිකාරය) | |
| (I) 16 (1ආ) සහ 20 (ආ) වගන්ති | අකාර්යක්ෂමභාවය, විෂමාචාරය යන හේතුව මත දායකයකු සේවයෙන් පහකරනු ලබන විට හෝ අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධූරයකට පත්කරනු ලැබූ විට රජයේ ප්‍රසාද මුදල් සම්බන්ධයෙන් ලැබුණු පොලියත් සමඟ ඒ දායකයාගේ ගිණුමට ආණ්ඩුව විසින් බැර කරන ලද ප්‍රසාද මුදල් ප්‍රමාණය අරමුදලින් ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතු වුවත් 2017 වර්ෂයට අදාලව එකතුව රු.474,425,527 ක් රජයේ ප්‍රසාද මුදල් හා පොලිය ලෙස ගෙවිය යුතුව පැවතුණි. |

(II) 25 වගන්තිය

එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, කේවල ලෙජර් ගිණුම් පවත්වා නොගැනීම හේතුවෙන් ඒ අනුව කටයුතු කිරීමට අරමුදලට නොහැකි වී තිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 වර්ෂයේ සිට පවතින රු.141,721 ක් වූ ඉදිරියට කළ ගෙවීම් ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විටත් හඳුනාගෙන නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,642,414,331 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,362,412,053 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.280,002,278 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආයෝජන මත පොලී ආදායම රු.281,505,452 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදි 2013 වර්ෂයේ රු.2,757,264,050 ක් වූ අතිරික්තය සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.5,642,414,331 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනිමේදී 2013 වර්ෂයේ රු.2,768,124,405 ක් වූ අරමුදලේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.5,736,195,733 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

විශ්‍රාම වැටුප් නොලැබෙන රජයේ සේවකයන් හට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික අරමුණුගතව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පිහිටුවා තිබුණි. එම අරමුණ ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරික්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 ජනවාරි 01 දිනට පැවති අයදුම්පත් 3,704 ඇතුළුව අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල මුළු අයදුම්පත්‍ර 9,376 ක් අතුරින් අයදුම්පත් 8,422 ක් සඳහා රු.497,808,187 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 954 ක් සඳහා ගෙවීම් කර නොතිබුණි.

(ආ) අරමුදලේ සාමාජිකයින් සඳහා අනිවාර්ය පොලිය වූ සියයට 2.5 සමඟ සමාලෝචිත වර්ෂය සඳහා සියයට 13 ක පොලි අනුපාතයක් ගෙවා තිබූ අතර 2016 වර්ෂය සඳහා ගෙවා තිබුණේ සියයට 12.34 කි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා සාමාජිකයන් වෙත ගෙවා තිබූ පොලි අනුපාතය සියයට 0.66 කින් වැඩි වී තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම හා ගිණුම් පොත්පත් නිසිපරිදි නඩත්තු නොකිරීම. |
| (ආ) සාමාජික කේවල ගිණුම් පාලනය. | දායකයින් සඳහා කේවල ගිණුම් පවත්වා නොගැනීම හා සාමාජික අවකරණ ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. |